| | |
|---|---|
| **පාඨමාලාව** | ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිඃ සිංහල භාෂා ප්‍රවේශය |
| **දේශක** | දිලිනි ආරියවංශ, සිංහල අධ්‍යයන අංශය (dilini1@yahoo.com) |
| **දිනය** | 2016. 09. 24. |

# ප්‍රත්‍යයාර්ථ නාම

ප්‍රත්‍යය එක් කිරීම නිසා විශේෂ අර්ථයක් පළ වන නාම, ප්‍රත්‍යයාර්ථ නාම වශයෙන් හැඳින්වෙයි. නිදසුන් වශයෙන්, ස්වර්ණ යන පදයෙන් ලැබෙන අර්ථයට වඩා විශේෂ අර්ථයක් ස්වර්ණමය යන පදයෙන් ලැබෙන්නේ 'මය' ප්‍රත්‍යය නිසා ය. √කර ප්‍රකෘතියට වඩා විශේෂ අර්ථයක් කරනු යන පදයෙන් ලැබෙන්නේ 'නු' ප්‍රත්‍යය නිසා ය. මේ පිළිබඳ සිදත්සඟරා විග්‍රහය මෙසේ ය.

දයින් නමින් හොත - කැරැ අරුතට නිසි පසන්
සපයා සදන් පස'රුත් - හිමි නො ලැඟැ ලොවැ වහරන් (8.1.)

''ධාතුවෙන් හෝ නාමයෙන් හෝ (පරව) අර්ථයට සුදුසු ප්‍රත්‍යයන් යොදා ලෝකයෙහි සීමා උල්ලංඝනය නො කොට ප්‍රත්‍යයාර්ථ නාමයන් සම්පාදනය කරවු.''

සිංහලයෙහි ප්‍රත්‍යයාර්ථ නාම දෙවැදෑරුම්.

1. තද්ධිත
2. කෘදන්ත

| **නාම ප්‍රකෘතිය + තද්ධිත ප්‍රත්‍යය = තද්ධිතය** |
|---|

කුමාරතුංග මුනිදාස තද්ධිත නාම හඳුන්වන්නේ 'නාම ප්‍රත්‍යය සංග්‍රහ නාම' වශයෙනි. ඔහු තද්ධිත ප්‍රත්‍යය විසි තුනක්, එම ප්‍රත්‍යය යෙදෙන අවස්ථා සහ ඒවායින් පළ වන අර්ථ ඔහු සිය ව්‍යාකරණ විවරණයෙහි දක්වයි.

1. 'ඉ' ප්‍රත්‍යයඃ අර්ථ කිහිපයක යෙදේ.

උදාඃ 'එහි වූයේ ය' යන අදහසඃ

*ගම්+ඉ* > *ගැමි* (ගමෙහි වූයේ)

*රට+ඉ* > *රැටි* (රටෙහි වූයේ)

'එහි යෙදුණේ ය' යන අදහසඃ

*තොට+ඉ* > *තොටි* (තොටෙහි නියුතු වූයේ)

*දහම්+ඉ* > *දැහැමි* (දහමෙහි නියුතු වූයේ)

'එයට සුදුසු ය' යන අදහසඃ

*සබ+ඉ > සැබි* (සභාවට සුදුසු වූයේ)

ස්වාර්ථය හෙවත් මුල් අදහස ම පළ වීමඃ

*අඳුරු+ඉ > ඇඳිරි*

*වදලු+ඉ > වැදැලි*

2. 'මුවා' ප්‍රත්‍යයඃ 'එයින් කෙරුණේ ය' යන අර්ථය

උදාඃ *රන්+මුවා > රන්මුවා* (රනින් කරන ලද)

*දැව+මුවා > දැවමුවා* (දැවයෙන් කරන ලද)

3. 'මය' ප්‍රත්‍යයඃ 'එයින් කෙරුණේ ය' යන අර්ථය

උදාඃ *ස්වර්ණ+මය > ස්වර්ණමය* (රනින් කරන ලද)

*දාරු+මය > දාරුමය* (දැවයෙන් කරන ලද)

❖ සංස්කෘත තත්සම පද සමග 'මය' ප්‍රත්‍යය ද තද්භව පද සමග 'මුවා' ප්‍රත්‍යය ද යෙදීම සිංහල සම්ප්‍රදාය යි. ඉහත නිදසුන් සලකන්න.

4. 'වත්' ප්‍රත්‍යයඃ 'ඇත' යන අර්ථය

උදාඃ *ගුණ+වත් > ගුණවත්* (ගුණ ඇති)

*පින්+වත් > පින්වත්* (පින් ඇති)

5. 'මත්' ප්‍රත්‍යයඃ 'ඇත' යන අර්ථය

උදාඃ *ඉසුරු+මත් > ඉසුරුමත්* (ඉසුරු ඇති)

*රූ+මත් > රූමත්* (රූ ඇති)

❖ ඉ, ඊ, උ, ඌ අන්ත පද සමග 'මත්' ප්‍රත්‍යය ද සෙසු ස්වරාන්ත හෝ ව්‍යංජනාන්ත පද සමග 'වත්' ප්‍රත්‍යය ද යෙදීම සිංහල සම්ප්‍රදාය යි.

6. 'තර' ප්‍රත්‍යයඃ 'දෙකක් අතුරින් වැඩි වූයේ' යන අර්ථය

උදාඃ *මිහිරි+තර > මිහිරිතර* (වඩා මිහිරි වූයේ)

*කුඩා+තර > කුඩාතර* (වඩා කුඩා වූයේ)

7. 'තම' ප්‍රත්‍යයඃ 'සියල්ල අතුරින් වැඩි වූයේ' යන අර්ථය

උදාඃ *මිහිරි+තම > මිහිරිතම* (ඉතා ම මිහිරි වූයේ)

*කුඩා+තම > කුඩාතම* (ඉතා ම කුඩා වූයේ)

8. 'ඉති' ප්‍රත්‍යයඃ ස්වල්පාර්ථය

උදාඃ *පැන්+ඉති > පැනිති* (පැන් ස්වල්පය)

*කැන්+ඉති > කැනිති* (කුඩා කැන)

❖ ප්‍රකෘතියෙන් අල්පාර්ථය ලැබෙන විට 'ඉති' ප්‍රත්‍යයෙන් අතිශයාර්ථය ද පළ වන බව කුමාරතුංග දක්වයි.

උදා: සුග+ඉති > සිගිති (ඉතා සුග)

පොඩි+ඉති > පොඩිති (ඉතා පොඩි)

9. 'අටි' ප්‍රත්‍යය: 'හුරු වූයේ' යන අර්ථය සහ ප්‍රදේශාර්ථය

උදා: දිගු+අටි > දිගටි (දිගට හුරු වූයේ)

මොළොක්+අටි > මොළොකටි (මොළොකට හුරු වූයේ)

ඉස්+අටි > ඉහටි (ඉස් පෙදෙස)

නහර+අටි > නහරටි > නාරටි (නහර පෙදෙස)

10. 'අටු' ප්‍රත්‍යය: බහුලාර්ථය සහ ස්වාර්ථය (ප්‍රකෘතියෙහි අර්ථය ම ලැබීම)

උදා: වක්+අටු > වකටු (වකුටු) (වක බොහෝ වූයේ)

කැස+අටු > කැසටු (කැහැටු) (බොහෝ කෙට්ටු වූයේ)

දොර+අටු > දොරටු ('දොර' යන අර්ථය ම ලැබේ.)

11. 'අස්' ප්‍රත්‍යය: ස්වාර්ථය

උදා: සිසිල්+අස් > සිසිලස්

වරල්+අස් > වරලස්

12. 'අත්' ප්‍රත්‍යය: ස්වාර්ථය

උදා: කොපුල්+අත් > කොපුලත්

මුදුන්+අත් > මුදුනත්

13. 'බ' ප්‍රත්‍යය: ස්ථානාර්ථය

උදා: එ+බ > එබ (එතැන)

මෙ+බ > මොබ (මෙතැන)

දිය+බ > දියබ/ දියඹ (දිය සහිත/ ගැඹුරු තැන)

14. 'තා' ප්‍රත්‍යය: සමූහාර්ථය සහ භාවාර්ථය

උදා: ජන+තා > දෙනෙතා (ජන සමූහය)

මුදු+තා > මුදුතා (මුදු බව)

15. 'ආණ' ප්‍රත්‍යය: ගෞරවාර්ථය

උදා: පිය+ආණ > පියාණ (ගරු කළ යුතු පියා)

සිටු+ආණ > සිටාණ (ගරු කළ යුතු සිටු)

16. 'අණු' ප්‍රත්‍යය: ගෞරවාර්ථය

උදා: පුත්+අණු > පුතණු (ගරු කළ යුතු පුතා)

තෙර+අණු > තෙරණු (ගරු කළ යුතු තෙර)

17. 'අණි' ප්‍රත්‍යය: ගෞරවාර්ථය

උදා: මා+අණි > මැණි (ගරු කළ යුතු මව)

*දූ+අණි* > *දියණි* (ගරු කළ යුතු දුව)

18. 'අ' ප්‍රත්‍යයː ජ්‍යෝෂ්ඨාර්ථය

උදාː *ගම්+අ* > *ගම* (ගමට ජ්‍යෝෂ්ඨ වූයේ)

*නුවර+අ* > *නුවර* (නුවරට ජ්‍යෝෂ්ඨ වූයේ)

19. 'එක්' ප්‍රත්‍යයː අනියමාර්ථය

උදාː *පුත්+එක්* > *පුතෙක්* (නියමයක් නොකළ පුතා)

*ගස්+එක්* > *ගසෙක්** (නියමයක් නොකළ ගස)

* අප්‍රාණවාචී පද සඳහා 'එක්' ප්‍රත්‍යය යෙදීම හෙළ හවුලෙහි සම්ප්‍රදාය යි.

20. 'උ' ප්‍රත්‍යයː ස්වාර්ථය

උදාː *නෙත්+උ* > *නෙතු* ('නෙත' යන අර්ථය ම ලැබේ.)

21. 'අළ' ප්‍රත්‍යයː ප්‍රදේශාර්ථය

උදාː *ඉස්+අළ* > *ඉහළ* (ඉස් පෙදෙස)

*පා+අළ* > *පහළ* (පා පෙදෙස)

22. 'ආ' ප්‍රත්‍යයː භාවාර්ථය ('බව' යන අර්ථය)

උදාː *අඬන+ආ* > *ඇඬියා* (අඬන බව)

23. 'උතු' ප්‍රත්‍යයː ස්වාර්ථය සහ බහුලාර්ථය

උදාː ඇඳුම් බොහෝ වූයේ - *ඇඳුතු*

කුමාරතුංග දක්වන ඉහත ප්‍රත්‍යයවලට අමතර ව වර්තමාන සිංහලයේ බහුල ව ව්‍යවහාර වන මිශ්‍ර සිංහල තද්ධිත ප්‍රත්‍යය කිහිපයක් ද හඳුනා ගැනීම සුදුසු ය.

- 'ඉක' ප්‍රත්‍යය 'එයට අයත්' යන අර්ථයෙන් යෙදේ.

උදාː *සමාජ+ඉක* > *සාමාජික*

*දින+ඉක* > *දෛනික*

*ඉතිහාස+ඉක* > *ඓතිහාසික*

*පුරාණ+ඉක* > *පෞරාණික*

*භූත+ඉක* > *භෞතික*

*ලෝක+ඉක* > *ලෞකික*

*වේද+ඉක* > *වෛදික*

- 'තන' ප්‍රත්‍යය කාලාර්ථයෙහි යෙදේ.

උදාː *පුරා+තන* > *පුරාතන*

*අද්‍ය+තන* > *අද්‍යතන*

- 'ඉෂ්ඨ' ප්‍රත්‍යය අතිශයාර්ථයෙහි යෙදේ.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

උදා:	*ජ්‍යා+ඉෂ්ඨ > ජ්‍යෙෂ්ඨ*

*කන්+ඉෂ්ඨ > කනිෂ්ඨ*

- 'ඊය' ප්‍රත්‍යය 'එහි වූයේ' යන අර්ථයෙන් යෙදේ.

උදා:	*විද්‍යාලය+ඊය > විද්‍යාලයීය*

*කාර්යාලය+ඊය > කාර්යාලයීය*

*සමාජ+ඊය > සමාජීය*

- 'ක' ප්‍රත්‍යය අස්ත්‍යර්ථයෙහි යෙදේ.

උදා:	*පන්ති+ක > පන්තික*

*සංස්කෘති+ක > සංස්කෘතික*

- 'ය' ප්‍රත්‍යය භාවාර්ථයෙහි යෙදේ.

උදා:	*තරුණ+ය > තාරුණ්‍ය*

*සමර්ථ+ය > සාමර්ථ්‍ය*

*නිපුණ+ය > නෛපුණ්‍ය*

*සුන්දර+ය > සෞන්දර්ය*

*සුහෘද්+ය > සෞහාර්ද්‍ය*

➢ මෙයට අමතර ව ද ව්‍යවහාර සිංහලයෙහි සුලබ ව යෙදෙන තද්ධිත ප්‍රත්‍යය කිහිපයක්, එම ප්‍රත්‍යය යෙදෙන වචන ආශ්‍රයෙන් හඳුනා ගැනීම සුදුසු ය.

*ඉන්දියා+ආනු > ඉන්දියානු*

*සර්ව+ඥ > සර්වඥ*

*ධන+වාදී > ධනවාදී*

*වැඩ+කාර > වැඩකාර*

*ත්‍යාග+ශීලී > ත්‍යාගශීලී*

| **ක්‍රියා ප්‍රකෘතිය + කෘදන්ත ප්‍රත්‍යය = කෘදන්තය** |
|---|

'කෘදන්ත' යන්නෙහි නිරුක්තිය කෘත් + අන්ත යන්න යි. සංස්කෘත ව්‍යාකරණයට අනුව 'කෘත්' ලෙස හැඳින්වෙනුයේ ක්‍රියා ප්‍රකෘතියකින් නාම පදයක් නිර්මාණය කර ගැනීමට උපයෝගී වන ප්‍රත්‍යය වන අතර, ඒ අනුව 'කෘදන්ත' යන්නෙන් අදහස් වන්නේ එම ප්‍රත්‍යයවලින් අවසන් වන නාම විශේෂය යි. සාමාන්‍යයෙන් සිංහල නාම පද නිර්මාණය වන්නේ නාම ප්‍රකෘතියක් සහ නාම ප්‍රත්‍යයක් සංයෝග වීමෙන් වුව ද මෙහි දී එම රටාව වෙනස් වෙයි. සිදත්සඟරා විග්‍රහයට අනුව කෘදන්ත නාම දෙකොටසකට බෙදේ. ක්‍රියාව කරන්නා ප්‍රකාශ වන කෘදන්ත අරුත් කිරිය

වශයෙන් සැලකේ. නිදසුනක් වශයෙන් ගත් කල 'බලන්නා', 'බලන්නී', 'බලන්නෝ' වැනි අවස්ථාවල දී 'බැලීමේ ක්‍රියාව' සිදු කරන තැනැත්තා, තැනැත්තිය හෝ තැනැත්තන් අදහස් වීම සිදු වේ. ක්‍රියා මාත්‍රය හඟවන කෘදන්ත භව් කිරිය වශයෙන් හඳුනා ගත හැකි ය. කියුම්, කියනු, කියමන් ආදි වශයෙනි.

සමකාලීන ව්‍යවහාර සිංහලයෙහි මූලික වශයෙන් කෘදන්ත ප්‍රභේද සතරකි.

(1) කර්තෘකාරක කෘදන්ත

(2) කර්මකාරක කෘදන්ත

(3) භාවකාරක කෘදන්ත

(4) කරණකාරක කෘදන්ත

**(1) කර්තෘකාරක කෘදන්ත**

කර්තෘකාරක කෘදන්ත, වර්තමාන කර්තෘකාරක කෘදන්ත සහ අතීත කර්තෘකාරක කෘදන්ත වශයෙන් නැවත කොටස් දෙකක් යටතේ හඳුනා ගත හැකි ය. වර්තමාන කාලයෙහි ක්‍රියාව සිදු වන බව හඟවන බලනු, රකිනු, හඬන, දුවන, බලනා, බස්නා වැනි කර්තෘකාරක කෘදන්ත වර්තමාන කර්තෘකාරක කෘදන්ත ලෙස හඳුනා ගත හැකි අතර, එහි දී -නු, -න සහ -නා යන ප්‍රත්‍යය සංයෝග වී ඇති බව පෙනේ.

ළමයා පොත <u>කියවනුයේ</u> වටපිට බලයි.

පොත <u>කියවන</u> ළමයා වටපිට බලයි.

පොත <u>කියවනා</u> ළමයා වටපිට බලයි.

කර්තෘ විසින් අතීතයේ දී කරන ලද ක්‍රියා හඟවනුයේ අතීත කර්තෘකාරක කෘදන්ත යි. එම පද නිර්මාණය සඳහා -ඉ, -උ, -ඌ සහ -ඇ ප්‍රත්‍යය එක් කෙරේ.

බුදුගෙට <u>පිවිසි</u> උපාසිකාව මල් පූජා කළා ය.

ඔබ <u>ගෙතූ</u> රූපය ඉතා මනරම් ය.

තනතුරු <u>දැරූ</u>යේ සුදුස්සන් ය.

ඇය <u>ගෑ</u> විලවුන්වල සුවඳ කාමරය පුරා විහිදෙයි.

'ස්' අන්ත ක්‍රියා ප්‍රකෘතිවල එම 'ස්' කාරය, අතීත කෘදන්ත නිර්මාණයේ දී 'ට' බවට පත් වන අතර 'ර' අන්ත ක්‍රියා ප්‍රකෘතිවල එම 'ර' කාරය අතීත කෘදන්තයේ දී 'ළ' බවට පත් වෙයි.

*නස් - නට, නටු*

*බස් - බට, බටු*

*වස් - වට*

*කර - කළ*

*වපුර - වපුළ*

*මතුර - මතුළ*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කෙසේ වෙතත් බට, මතුළ වැනි ඇතැම් පද වෙනුවට වර්තමාන ලේඛන ව්‍යවහාරයට බැස්ස, මැතිරූ වැනි පද එක් වන බව දැක ගත හැකි ය.

**(2) කර්මකාරක කෘදන්ත**

කර්මයා ගේ ක්‍රියා හඟවන කෘදන්ත කර්මකාරක කෘදන්ත වශයෙන් හඳුනා ගත හැකි ය. මේවා ද වර්තමාන කර්මකාරක කෘදන්ත සහ අතීත කර්මකාරක කෘදන්ත වශයෙන් දෙවැදෑරුමි. කර්මයා විසින් වර්තමානයේ කරනු ලබන ක්‍රියා, වර්තමාන කර්මකාරක කෘදන්ත ලෙස සැලකේ. එම පද නිර්මාණය සඳහා ක්‍රියා ප්‍රකෘතිය සහ කෘදන්ත ප්‍රත්‍යය අතර 'එ' ස්වරය යෙදී ස්වර පෙරළිය සිදු වෙයි.

*බල - එ - නු > බැලෙනු*

*බල - එ - න > බැලෙන*

*බල - එ - නා > බැලෙනා*

ගුරුවරයා විසින් ඉගැන්වෙනුයේ ව්‍යාකරණ ය.

ගායිකාව විසින් ගැයෙන ගීය මනරම් ය.

දිනපතා කෙරෙනා ක්‍රීඩා වෙහෙසකර ය.

කර්මයා විසින් අතීතයේ කරන ලද ක්‍රියා, අතීත කර්මකාරක කෘදන්ත ලෙස සැලකේ. -උණ සහ -උණු ප්‍රත්‍යය භාවිතයෙන් මෙම කෘදන්ත නිර්මාණය වේ. කැපුණ, මැරුණ, බැලුණු, රකුණු ආදි වශයෙනි.

කම්කරුවන් විසින් කැපුණ මාවත ප්‍රයෝජනවත් ය.

මා විසින් බැලුණු චිත්‍රපටිය රසවත් ය.

- ❖ කර්තෘකාරක හෝ කර්මකාරක අතීත කෘදන්ත ලෙස සැලකිය හැකි, -පූ සහ -ලූ අන්ත ස්වරූප විශේෂයක් ගයිගර් හඳුනා ගනී. මැරූ, කියූ වැනි රූප වෙනුවට මරාපූ/ මරාලූ, කියාපූ/ කියාලූ ආදි වශයෙන් වරනැගීම මෙයට නිදසුනි. මෙබඳු රූප බෙහෙවින් හමු වන්නේ සම්භාව්‍ය සාහිත්‍යයෙහි ය.

**(3) භාවකාරක කෘදන්ත**

ක්‍රියා භාවයක් හෙවත් ක්‍රියා මාත්‍රයක් ප්‍රකාශ කරන කෘදන්ත භාවකාරක කෘදන්ත ලෙස හැඳින්වෙන අතර, -නු, -උම්, -ඊම්, -ඉලි, -මන් යන ප්‍රත්‍යය එම කෘදන්ත නිර්මාණය සඳහා යෙදේ.

සරසවිසිසුන් උද්ඝෝෂණයක යෙදෙනු පෙනේ.

ඔහු ගේ කියුම් කෙරුම් තැනට සුදුසු නැත.

මැගේ නැටීම් ගැයීම් සිත්ගන්නාසුලු ය.

අපි සියලු ලියකියවිලි භාර දුන්නෙමු.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණු විශ්වවිද්‍යාලය

ඔබ ගේ කියමන් සදා අප මතකයේ රැඳේ.

**(4) කරණකාරක කෘදන්ත**

යම් යම් උපකරණ හැඳින්වීම සඳහා කරණකාරක කෘදන්ත යෙදෙයි. එහි දී -න, -නා යන ප්‍රත්‍යය භාවිත වේ. දුර-බලනය, දිය-බස්නාව ආදි වශයෙනි.

පිසිනුයේ යමකින් ද - පිස්නාව

දවටනුයේ යමකින් ද - දවටනය

පොරවනුයේ යමකින් ද - පොරවනය

ව්‍යවහාර සිංහලයෙහි කෘදන්ත යෙදෙන ආකාර තුනක් හඳුනා ගත හැකි ය.

(1) නාම පදයක් ලෙස

(2) වාක්‍යාවසාන ක්‍රියාවක් ලෙස

(3) නාම විශේෂණයක් ලෙස

**(1) නාම පදයක් ලෙස යෙදීම**

සියලු විභක්තිවල වරනැඟෙමින්, කෘදන්ත නාමපද වශයෙන් වාක්‍යවල යෙදේ.

බත පිසින්නී අම්මා ය.

අපි පාරේ ගමන් කරන්නන් පසු කරමු.

පුස්තකාලයට එන්නන් විසින් මේ පොත නිතර කියවනු ලැබේ.

දුක් විඳින්නන් කරණ කොට අනුකම්පාව ඉපදෙයි.

ඔවුහු සිඟමන් යදින්නාට ආහාර ලබා දුන් හ.

බවුන් වඩන්නා ගෙන් ගමට සෙත සැලසිණි.

යුතුකම් ඉටු කරන්නන් ගේ ජය නියත ය.

බොරු කියන්නන් කෙරෙහි අනුකම්පා කරමු.

දුව පැන ඇවිදින්නනි, මඳක් සන්සුන් වන්න.

**(2) වාක්‍යාවසාන ක්‍රියාවක් ලෙස යෙදීම**

වාක්‍යාවසාන ක්‍රියා පදයක් ලෙස කෘදන්ත හැසිරීමේ දී ලිංග භජනය සහ පුරුෂ අනුව වරනැඟීම සිදු වේ.

මම ඒ වැඩය කරන්නෙමි.

ඔවුහු බොහෝ වේලාවක් පොතපත කියෙව්වෝ ය.

දෙමවුපියන් අතින් නුඹලා පෝෂණය වුණෙහු.

පළමු නිදසුනෙහි දැක්වෙන 'කරන්නෙමි' වැනි ක්‍රියාවක් හඳුනා ගත යුත්තේ කෘදන්ත ක්‍රියාවක් වශයෙනි. ඇතැමකු 'කරමි' යන්න වර්තමාන කාල ක්‍රියාව වශයෙන් ද 'කරන්නෙමි' යන්න අනාගත කාල ක්‍රියාව වශයෙන් ද හඳුනා ගන්නා නමුත්, දෙවැන්නෙහි ඇත්තේ අනාගත කාල ප්‍රත්‍යයක් නොව කෘදන්ත ප්‍රත්‍යයක් බව පැහැදිලි ය. එබැවින් කිසිදු විටෙක කෘදන්ත ප්‍රත්‍යය අනාගත කාල ප්‍රත්‍යය ලෙස වරදවා වටහා නොගත යුතු ය.

**(3) නාම විශේෂණයක් ලෙස යෙදීම**

ව්‍යවහාර සිංහලයෙහි නාම විශේෂණ වශයෙන් කෘදන්ත යෙදෙන අවස්ථා ද හමු වෙයි.

අපි පත්තරය <u>කියවන</u> මිනිසා දුටිමු.
චිත්‍රශිල්පියා විසින් <u>ඇඳෙනා</u> සිතුවම් ඔවුහු මිලට ගත් හ.
මා අතු<u>ගෑ</u> කාමරය අපිළිවෙළ තැනක් විය.

සිංහලයෙහි ප්‍රත්‍යයාර්ථ නාම වශයෙන් තද්ධිත සහ කෘදන්ත පිළිබඳ ඉහත දැක්වෙන ආකාරයේ විග්‍රහයක් සිදු කළ හැකි ය.

## සිංහල භාෂාවෙහි ලිංගභේදය

සිංහලයෙහි ලිංග භේදය පිළිබඳ සිදත් සඟරාවෙහි හමු වන්නේ මෙබඳු සඳහනකි.

සකුසත් අනුසෙරෙන් - ඇත ද සදනට ලිඟු බේ
නො පැනේ වහරවෙසෙසෙක් - පුමඉතිරිලිඟු දෙක විනා
පණින් හදත් යුත් - පවසනුයෙ පුමලිඟු වේ
සහයොන් සතුන් කියලූ - සද වේ ඉතිරිලිඟු නම් (3.1.)

''නාමපදවලට සංස්කෘත ශාස්ත්‍රානුසාරයෙන් ලිංග භේදයක් පැවතිය ද (සිංහලයෙහි) පුරුෂ ලිංග ස්ත්‍රී ලිංග හැර ව්‍යවහාරයක් දක්නට නො ලැබේ. පුරුෂ ව්‍යංජනයෙන් යුක්ත වූ ප්‍රාණීන් ප්‍රකාශ කරන්නේ පුරුෂ ලිංග ය. යෝනි සහිත සත්ත්වයන් ප්‍රකාශ කරන්නේ ස්ත්‍රී ලිංග ය.''

මේ අනුව සිදත් සඟරාවෙන් ඉදිරිපත් වන්නේ ජීව විද්‍යාත්මක ලිංග භේදයකි. එසේ ම මෙම විග්‍රහයට අනුව සිංහලයෙහි නපුංසක ලිංග ස්වරූපයක් නො පවතී. කෙසේ වෙතත් සිදත් සඟරාකරු අනතුරු ව පෙලඹෙන්නේ නපුංසක ලිංග නාම පද පුරුෂ ලිංග සහ ස්ත්‍රී ලිංග වශයෙන් බෙදා දැක්වීමට බැවින් ''පණින් හදත් යුත් - පවසනුයෙ පුමලිඟු වේ, සහයොන් සතුන් කියලූ - සද වේ ඉතිරිලිඟු නම්'' යන ඔහු ගේ ම නිර්වචනය බිඳ වැටේ.

උදාː දිය (ලෝකය, ජය, ජලය), දල (පත්‍ර, ජලය, ගින්න), ඇදුරු (පර්වතය, පණ්ඩිත, ආචාර්ය), මේ (මේඝ), අඹර (ආකාශය, වස්ත්‍රය), අවි (ආයුධ), තුරු (ගස්), රණ (යුද්ධ), හදන් (ලිංග), රෝ (රෝග), රා (රාග, වර්ණ, රාහු), ගහ (ග්‍රහ), මරු (සුළඟ, මාර), දහන් (ධ්‍යාන), අඟ (අවයව), ගුම් (ගුල්ම, ග්‍රීෂ්ම, ගර්ජන), සඳ (චන්ද්‍ර, ඡන්දස්, සන්ධි), රස (රසය, ජලය) වැනි ශබ්ද පුරුෂ ලිංග වශයෙන් ද විදු (විද්‍යුත්), ලිය (ලතා), වසා (රෝම), පෙළ (පෙළ, පීඩා), නිසා (රාත්‍රී), දෝ (ජ්‍යෝතිෂ), ලද (ලජ්ජා, ලබ්ධි), පැන (ප්‍රඥා) වැනි ශබ්ද ස්ත්‍රී ලිංග වශයෙන් ද දැක්වීම

කුමාරතුංග මුනිදාස, සිංහල නාමපද ලිංග සතරකට බෙදා දක්වයි.

1. පුරුෂ ලිංග
2. ස්ත්‍රී ලිංග
3. නපුංසක ලිංග
4. සාධාරණ ලිංග

පුරුෂයකු හඟවන නාමපද පුරුෂ ලිංග ද ස්ත්‍රියක හඟවන නාමපද ස්ත්‍රී ලිංග ද අචේතන වස්තු හඟවන නාමපද නපුංසක ලිංග ද වෙයි. තුන් ලිංගයට ම සාධාරණ ශබ්ද (උදාː ගුණ නාම සහ සර්ව නාම) සාධාරණ ලිංග වේ.

කුමාරතුංගට අනුව, පුරුෂ ලිංග ශබ්දයක් ස්ත්‍රී ලිංග බවට පත් කළ හැකි ක්‍රම තුනකි.

1. අනමාකරණය

    බමුණු-බැමිණි, සතුරු-සැතිරි, කුකුළු-කිකිළි, කොලු-කෙලි, සොර-සෙර

2. ස්ත්‍රී ප්‍රත්‍යය යෝගය (ඊ, ඉනි ආදිය)

    යනු-යන්නී, කුමර-කුමරී, කොක්-කෙකිනි, සප්-සැපිනි, ඇත්-ඇතිනි

3. ස්ත්‍රී ප්‍රකෘති සංග්‍රහය

    සිටු-සිටු දේවි, කොටි-කොටි දෙන, අශ්වයා-වෙළඹ, මොනරා-මොනර කිකිළිය

## සමාස

''නේ සදන් සියොවැ එක සද අයුරක් වන සේ ගළපනු සමස් නම්'' යන සිදත් සඟරා විග්‍රහයට අනුව, විවිධ ශබ්ද එක් වී එක් ශබ්දයක් වන සේ ගැළපීම සමාස නම් වෙයි. මෙහි දී යුක්තාර්ථවත් භාවය වැදගත් සාධකයකි. එනම්, සමාසයක් ලෙස ගැළපිය හැක්කේ එසේ ගැළපීම යුක්තිසහගත වන පද පමණි. ඉරහඳ, පුටුමේස වශයෙන් සමාස කළ හැකි නමුත් ඉරපුටු, සඳමේස වශයෙන් සමාස කළ හැකි නො වේ.

සිදත් සඟරා විග්‍රහයට අනුව සිංහලයෙහි සමාස වර්ග පහකි.

(1) අවිය සමස් (අව්‍ය සමාසය)

(2) විබත් සමස් (විභක්ති සමාසය)

(3) වෙසෙසුන් සමස් (විශේෂණ සමාසය)

(4) අන් අරුත් සමස් (අන්‍යාර්ථ සමාසය)

(5) ද අරුත් සමස් (දකාරාර්ථ සමාසය)

**(1) අවිය සමස් (අව්‍ය සමාසය)**

නිපාතයක් හෝ උපසර්ගයක් තවත් පදයක් හා එක් වීමෙන් නිර්මාණය වන සමාස විශේෂය මෙලෙස හැඳින්වේ.

උදා: අනුනායක, යථාකාලය, සුවඳ, දුගඳ, සුචරිත, දුදන, උපප්‍රධාන, අකුසල්

**(2) විබත් සමස් (විභක්ති සමාසය)**

ප්‍රථම, ආලපන හැර වෙනත් විභක්තියකට අයත් පදයක් මුල් පදය වශයෙන් යෙදෙන සමාස මෙනමින් හැඳින්වෙයි.

උදා: කර්ම විභක්ති සමාස - ගත්කරු (ගත් කරනුයේ), මීපල් (මිහිය පාලනය කරනුයේ)

කර්තෘ විභක්ති සමාස - පරපුටු (පරා විසින් පුටුයේ), බඹදත් (බඹු විසින් දෙන ලද්දේ)

කරණ විභක්ති සමාස - කිරිබත් (කිරෙන් පිසූ බත්), රන්කම් (රනින් කරන ලද කම්)

සම්ප්‍රදාන විභක්ති සමාස - බුදුපුද (බුදුනට කරන ලද පුද), බමුණුදන් (බමුණනට දෙන දන්)

අවධි විභක්ති සමාස - සොරබිය (සොරුන් ගෙන් වන බිය), මිණිමුතු (මිණියෙන් මුතු-පිපුණු)

සම්බන්ධ විභක්ති සමාස - බුදුබණ (බුදුන් ගේ බණ), හිරුරැස් (හිරු ගේ රැස්)

ආධාර විභක්ති සමාස - වනමල් (වනෙහි මල්), පොල්තෙල් (පොලෙහි තෙල්)

**(3) වෙසෙසුන් සමස් (විශේෂණ සමාසය)**

විශේෂණයක් සහ විශේෂ්‍යයක් එක් වීමෙන් මෙම සමාසය නිර්මාණය වෙයි.

උදා: විශේෂණ පූර්ව පද සමාස - රතුමල්, නිල්අහස, උසළමයා, අලුත්පොත්

විශේෂණ උත්තර පද සමාස - සිදුහත්කුමරු, ගුත්තිලඇදුරු

උපමාන පූර්ව පද සමාස - ලියකොමළ, ගල්හිත, මල්හිනාව

උපමාන උත්තර පද සමාස - නරරකුසා, කොලුතාත්තා

සංඛ්‍යා පූර්ව පද සමාස - පන්සිල්, තිසරණ, සතරදිශා

**(4) අන් අරුත් සමස් (අන්‍යාර්ථ සමාසය)**

සමාස වීමට පූර්වයෙන් පැවති අර්ථයට වෙනස් අර්ථයක් සමාස වූ පදවලින් පළ වේ නම් මෙම සමාස විශේෂය යටතට ගැනේ.

උදා: එරුණුහස් (හස එරුණේ යමක ද - විල) කර්ම විභක්ති අන්‍යාර්ථ

දැමිඳුරු (දමන ලද ඉඳුරන් ඇත්තේ යමකුට ද - මුනි) කර්තෘ විභක්ති අන්‍යාර්ථ

සුන්බත් (බත සුන් වූයේ යමකින් ද - කලහය) කරණ විභක්ති අන්‍යාර්ථ

දුන්වත් (දෙන ලද වස්ත්‍ර ඇත්තේ යමකුට ද - බමුණා) සම්ප්‍රදාන විභක්ති අන්‍යාර්ථ

ගිලිගොනඟුල් (ගිලිහුණු ගොනඟුල් යමකින් ද - ගස) අවධි විභක්ති අන්‍යාර්ථ

සිගුවලඟ (සිහින් ඉඟක් ඇත්තේ යම් තැනැත්තියක ගේ ද - කාන්තාව) සම්බන්ධ විභක්ති අන්‍යාර්ථ

මත්නේගජ (මත් ඇතුන් ඇත්තේ යම් තැනක ද - වනය) ආධාර විභක්ති අන්‍යාර්ථ

**(5) ද අරුත් සමස් (දකාරාර්ථ සමාසය)**

සමුච්චාර්ථයෙන් යෙදෙන පද කිහිපයක් එක් වීමෙන් මෙම සමාස නිර්මාණය වේ.

උදා: හිරුසඳු, ගීනැටුම්, ඇත්අස්රියපාබල

**ආශ්‍රේය මූලාශ්‍රය**


ඒ. ඒ. අභයසිංහ (සංස්.). **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව.** කර්තෘ ප්‍රකාශන, 1998.

කරුණාතිලක, ඩබ්. එස්. ''පද සංරචනය (කෘදන්ත පද)'' **සම්භාෂා: 5 කලාපය** බත්තරමුල්ල: පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, 1993.

ගයිගර්, විල්හැම්. **සිංහල භාෂාවේ ව්‍යාකරණය**, පරි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. කොළඹ: රාජකීය ආසියාතික සංගමය, 1964.

දිසානායක, ජේ. බී. **සිංහල රීතිය-7: පද නිර්මාණය** කළුබෝවිල: සුමිත ප්‍රකාශකයෝ, 2014.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ. **සිදත්සඟරා විමසුම.** කර්තෘ ප්‍රකාශන, 2004.

පෙරේරා, තියඩෝර් ජී. **සිංහල භාෂාව.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1946.

මුනිදාස, කුමාරතුංග. **ව්‍යාකරණ විවරණය, නව මුද්‍රණය.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1983.

**සිංහල ලේඛන රීතිය**, නව සංස්කරණය. මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය, 2001.

සුමනසාර හිමි, තිඹිරිවැව. **සිංහල භාෂාවේ ව්‍යාකරණය** බොරලැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2007.


දූරස්ථ අධ්‍යාපන ඒකකය-රුහුණු විශ්වවිද්‍යාලය